# ලංකා විදුලි බල මණ්ඩලය
# බෙදාහැරීම් අංශ - 01 වයඹ පළාත - 2
# කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

2021 වර්ෂය සඳහා ලංකා විදුලි බල මණ්ඩලයේ බෙදාහැරීම් අංශ - 01ට අයත් වයඹ පළාත - 2 සඳහා සේවා සැපයීමට ලියාපදිංචි වීමට කැමති කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයිතම් වර්ගය**

සේවා සැපයුම : වර්ගය 01 ; උපපොල සඳහා මනුරු සවි කිරීම

**ඉල්ලුම්කරුවන් සඳහා උපදෙස්**

01. අදාල අයදුම් පත් 2021-04-21 වන දින දක්වා කුරුණෑගල, රජපිහිල්ල පාර, අංක 25 පිහිටි වයඹ පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලය -2 මගින් පෙ.ව.09.00 සිට ප.ව.03.30 දක්වා මිළදී ගත හැකිය. අදාළ එක් එක් අයදුම්පත සඳහා ආපසු නොගෙවනු ලබන රු.1,000.00 ක වටිනාකමකින් යුතු"සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය" නමට ලියන ලද බැංකු අණකරයක් මගින් හෝ ලංවිම මගින් නිකුත් කරනු ලබන ගෙවීම් වවුචරයක් මගින් ගෙවීම් කළ යුතුය.

02. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වයඹ කාර්යාලය - 2 වෙත ලියාපදිංචි තැපෑලෙන් 2021-04-22 දින පෙ.ව 10.00 ට පෙර ලැබෙන පරිදි එවිය යුතුය.අතින් ගෙනවිත් භාරදෙන අයදුම්පත් ඉහත සඳහන් දින එම වෙලාවට පෙර ලංකා විදුලිබල මණ්ඩලයේ වයඹ පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුය. අයදුම්පත සහිත ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ"Registration of Contractors - 2021" ලෙස සඳහන් කළ යුතුය.

03. 2021-04-22 දින පෙ.ව 10.00න් පසුව ලැබෙන අයදුම් පත් භාරගනු නොලබන අතර,ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. අයදුම්පත් කට්ටල සහ ඒ පිළිබඳ වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් ලබා ගත හැකිය.


ප්‍රධාන ඉංජිනේරු (වාණිජ),<br>
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වයඹ - 2) කාර්යාලය,<br>
ලංකා විදුලිබල මණ්ඩලය,<br>
අංක - 25,<br>
රජපිහිල්ල පාර,<br>
කුරුණෑගල,

දු.ක. :037-2065498<br>
ෆැක්ස් :037-2065497,


නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වයඹ පළාත - 2)<br>
ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලය<br>
இலங்கை மின்சார சபை<br>
CEYLON ELECTRICITY BOARD